# ඉතිහාසයේ විශාලතම ජල පාලන ව්‍යාපාරය

# මෙල්ල වන මහවැලිය

**වසර දෙදහස් පන්සියයකටත් වඩා ඉපැරණි වාරිකර්ම ශිෂ්ඨාචාරයකට හිමිකම් කියන ශ්‍රී ලංකාවෙහි මෙතෙක් වාර්තා ගත විශාලතම ජල පාලන ව්‍යාපාරය වනාහි මහවැලිය යි. කල්පාන්තරයක් මුළුල්ලේ මව් බිමෙහි සාරයෙන් මහ සයුර පෝෂණය කළ මහවැලිය අද සිය ගමන් මග වෙනස් කරමින් ජාතිය පෝෂණය කිරීමේ ශ්‍රේෂ්ඨ මෙහෙවරක යෙදී සිටින්නීය.**

මහවැලි ගංගා නිම්නය වර්ග සැතපුම් 4030 ක් පුරා විහිදී පවතී. මහවැලිය ඔස්සේ වාර්ෂිකව මුහුදට ගලා යන ජල ප්‍රමාණය අක්කර අඩි66 ලක්ෂයක් ඉක්මවා සිටී. මෙයින් අක්කර අඩි 47 ලක්ෂයක ජල සම්පත් ප්‍රමාණයක් සංවර්ධනය සඳහා යොද ගත හැකි ය. මේ හැර මදුරා ඔයේ හා යෝජිත සංවර්ධන ප්‍රදේශයේ අනිකුත් කුඩා ගංගාවල ගැලීම් ප්‍රමාණයෙන් අක්කර අඩි 9 ලක්ෂයක් ද යෝජිත සංවර්ධන කාර්යය සඳහා යොද ගත හැකි බව වැඩිදුරටත් පෙන්වා දි ඇත.

මෙසේ යැපයෙන ජල සම්පතින් ඉඩම් අක්කර 9,00,000 ක් දෙකන්නයේ වගා කළ හැකි බව එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආයතනයේ හා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ විශේෂඥයන් සකස් කළ වාර්තාවෙන් පෙන්වා දී තිබිණ. මෙයින් අක්කර 6,50,000 ක් අළුතෙන් සංවර්ධනය කළ යුතු බිම් වන අතර, මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන දිවයිනේ වියළි කලාපයේ භූමි ප්‍රමාණයෙන් සියයට 55 ක් විය.

මේ හැර මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ මෙගවොට් 500 කට අධික ස්ථාපිත ධාරිතාවක් ඇති ජල විදුලි බලාගාර ගණනාවක් ඉදි කළ හැකි යයි පෙන්වා දුන් වාර්තාව එම ජල විදුලි බලාගාරයන් ගෙන් වාර්ෂිකව දහසුවොත් පැය 380 කෝටියක විදුලි බලයක් ජනනය කළ හැකි බව ද, සඳහන් කළේය. මෙය මුළු දිවයිනේ ජල විදුලි ජනන හැකියාවෙන් (වාර්ෂික ජනන හැකියාව දහසුවොත් පැය 630 කෝටියකි). අඩකටත් වැඩි ප්‍රමාණයකි.

සංවර්ධන ප්‍රදේශයේ කළයුතු නව ඉදි කිරීම් හැරුණ විට පැරණි වැව්, අමුණු හා ඇලමං ද යෝජනා ක්‍රමයේ අංගයන් ලෙස එක්කර තිබීම මෙම වාර්තාවේ විශේෂ ලක්ෂණයක් ලෙස හැඳින් විය හැකි ය. මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ පළමු අදියරෙහි ඉදි කිරීම් කටයුතු 1970 පෙපරවාරි මස 28 වැනි දින මහනුවරට නුදුරු පොල්ගොල්ලේ දී ආරම්භ කෙරිණ.

## පොල්ගොල්ල

මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ පළමු අදියරෙහි පළමු පියවරට පොල්ගොල්ලේ හා බෝවතැන්නේ හැරවුම් නිර්මිති, හැරවුම් උමං හා ඇළ මං ඉදි කිරීම අයත් විය. දැනට සම්පූර්ණයෙන් ම පාහේ අවසන් වී ඇති මෙම පියවරෙහි ඉදි කිරීම් කටයුතු සඳහා රුපියල් තිස් තුන් කෝටියකට අධික මුදලක් වැය විය.

මෙම පියවරෙහි ප්‍රධාන නිර්මාණය වන්නේ පොල්ගොල්ලේ මහවැලි ගඟ හරහා ඉදි කොට ඇති යෝධ අමුණ යි.

දිගින් අඩි 565 ක්, පළලින් අඩි 34 ක් හා උසින් අඩි 55 ක් වන මෙම අමුණ නිසා, මහවැලි ජලය එක් රොක් වී ජලාශයක් නිර්මාණය වී ඇත.

මහවැලි ජලයෙන් කොටසක් උතුරු මැද පළාතට හැරවෙන්නේ මෙම ජලාශයෙනි. පොල්ගොල්ලේ සිට උකුවෙල දක්වා ඉදිව ඇති දිගින් අඩි 26,450 ක් හා විශ්කම්භයෙන් අඩි 19½ ක් වන යෝධ උමගේ උමං දෙරටුව පිහිටා ඇත්තේ මෙම ජලශය හා සම්බන්ධිතව ය. සෑම තත්පරය කටම ජලය ඝන අඩි 2,000 ක් (ගැලුම් 12,500 ක්) මෙම උමඟ ඔස්සේ ගලා යැවිය හැකි වෙයි.

**මෙම උමං මඟ ඔස්සේ වාර්ෂිකව රජ රටට හැරවිය හැකි මහවැලි ජල ප්‍රමාණය අක්කර අඩි 11 ලක්ෂයක් පමණ වෙයි. මෙය කලා වැව පිරී ඉතිරෙන විට දරා සිටින ජල ප්‍රමාණය මෙන් දෙළොස් ගුණයක් තරම් වන්නේ ය.**

උමඟ ඔස්සේ ගලා එන මහවැලි ජල කඳ මෙගවොට් 40 ක විදුලි බල නිෂ්පාදන ශක්තියකින් යුත් උකුවෙල ජල විදුලි බලාගාරය මැදින් ගලා විත් දුංඔය හා සුදු ගඟ ඔස්සේ අඹන් ගඟට පිවිසෙයි.

පොල්ගොල්ලෙන් හරවනුලැබ දුංඔය හා සුදු ගඟ ඔස්සේ ගලා අවුත් අඹන් ගඟට පිවිසි මහවැලි ජල ප්‍රවාහයට අඹන් ගඟේ සාමාන්‍ය ගැලීම් ප්‍රමාණය ද එක් වෙයි. බෝවතැන්නේ අඹන් ගඟ හරහා ඉදි වී තිබෙන දිගින් අඩි 1048 ක් හා උපරිම උසින් අඩි 100 ක් වූ යෝධ වේල්ලෙන් නිර්මාණය වී ඇති මහා ජලාශයට මෙම ජල ප්‍රවාහය එක් වෙයි. මෙම ජලාශය අක්කර 1500 කට අධික භූමි ප්‍රමාණයක් පුරා විහිදී ඇත්තකි.

## බෝවතැන්න

බෝවතැන්න රජරට කෙත් බිම් සරු කිරීමට මහවැලි ජලය බෙද හරින මධ්‍යස්ථානය වැන්න. බෝවතැන්න ජලාශයේ රැඳවුණු ජලයෙන් අඩක් අනුරාධපුර පෙදෙසට ද (නුවර කලාවිය) ඉතිරි අඩ පොළොන්නරුව පෙදෙසට ද (තමන්කඩුව) බෙද හරිනු ලැබේ.

**බෝවතැන්න ජලාශයේ එක් වී ඇති මහ ජල කඳෙන් සෑම තත්පරයකට ඝන අඩි 1000 ක් කලාඔය නිම්නයට ගෙන යනු ලබන්නේ බෝව තැන්නේ සිට දඹුල්ල අසල ලෙන දෙර දක්වා තනා ඇති, දිගින් අඩි 22,468 ක් වන උමඟ තුළිනි.**

බෝවතැන්න ලෙනදෙර උමඟ ඔස්සේ ගලන මහවැලි ජල කඳ උමං කෙළවර සිට දඹුලු ඔය දෙසට විහිදී, කොන්ක්‍රීට් ආස්තරණය කළ ඇල මහ දිගේ මඳ දුරක් ගලා, අතරමඟ දිය බෙදුමෙන් බිඳී වැඩි කොටස දඹුලු ඔය දෙසටත් අනිත් කොටස කන්දලම වැව දෙසට යොමු වූ ඇල මහකටත් පිවිසෙයි. මෙහි දී දඹුලු ඔය දෙසට යොමු කෙරෙන උපරිම ජල ප්‍රමාණය තත්ත්පරයට ඝන අඩි 750 ක් වන අතර, කන්දලම වැව දෙසට යොමු කෙරෙන උපරිම ජල ප්‍රමාණය තත්පරයට ඝන අඩි 250 ක් වෙයි. මෙම ජල ප්‍රමාණය උපරිමව හැරවෙන අවස්ථාවන්හි දී එයින් තත්පර යට ඝන අඩි 150 ක් කන්දලම වැවට ද, තත්පර යකට ඝන අඩි 100 ක් හුරුළු වැවට ද යොමු කෙරෙයි.

## නුවර කලාවියට

දඹුලු ඔය දෙසට ඇල මඟ දිගේ ගලන මහ වැලි ජල කඳ ඇල මඟ කෙළෙවර දී දඹුලු ඔයට පිවිස, දඹුලු ඔය ඔස්සේ ගලා කලා වැවට පිවිසෙයි. මෙසේ ලැබෙන අමතර ජල ප්‍රමාණය රඳවා ගැනීම පිණිස කලා වැවේ පිටවාන අඩි 4 කින් උස් කර ඇති අතර වැකන්ද ද සවිමත් කොට ඇත.

**කලාවැව, මහවැලි ජලය අනුරාධපුර දිස්ත්‍රික් කයේ වැව් වලට බෙද හරින මධ්‍යස්ථානයක් බඳු වෙයි. කලා වැවට පිවිසි මහවැලි ජලය, කලා දකුණු ඉවුර යෝධ ඇල ඔස්සේ ගලා නාච්චදූව වැව, බසවක්කුලම, නුවර වැව හා තිසා වැව යන අනුරාධපුර ශුද්ධ නගරයේ වැව් පුරවා ලයි. මෙසේ මහවැලි ජලය කලා වැවෙන් පෞරාණික අනුරාධ පුර ශුද්ධ නගරය කරා ගෙන යන්නේ ඉපැරණි යෝධ ඇල මගිනි.**

කලා–බළලු වැවෙන් නික්මෙන වම් ඉවුර ඇල මගින් උස්ගල සියඹලන්ගමුව, රාජාංගන, මහකන්නෝරුව, මුලනටුව, ගල්නෑව ආදී වැව් වලටත් තවත් කුඩා වැව් ගණනාවකටත් මහවැලි ජලය සැපයේ.

කලා වැව යටතේ හා කලා වැව ඔස්සේ ජලය සැපයෙන අන්කුත් වැව් යටතේ, මහවැලි ජලය ලබන දනට වගා කෙරෙන ඉඩම් ප්‍රමාණය අක්කර 41,500 කට අධික ය. මෙයින් අක්කර

13,000 ක් කලා වැව යටතට ගැනෙන අතර, රාජාංගන, උස්ගල – සියඹලන්ගමුව හා අංගමුව ව්‍යාපාරයන් යටතට අක්කර 18,500 ක් ගැනෙයි. නාච්චදූව, බයවක්කුලම, තිසාවැව, ආදී අනුරාධ පුර නගරයේ වැව් යටතට ගැනෙන කුඹුරු ප්‍රමාණය අක්කර 10,000 කි.

මහවැලි ජලයෙන් පෝෂණය වන කන්දලම වැව යටතේ මෙතෙක් වගා කළ කෙත් බිම් අක්කර 3,400 ක් ද, හුරුළු වැව යටතේ දැඩි ජල හිඟයකට ලක් වීමෙන් ගත වුණ හත් විසි වසරක් තිස්සේ නිසි වගාවක් නො වූ කෙත් බිම් අක්කර 8,000 ක් ද, දැන් දෙකන්නයේ වගා කෙරේ.

නුදුරු අනාගතයේ දී මොරගහකන්ද ජලාශය ඉදි කිරීමෙන් පසු එමගින් හුරුළු වැවට ජලය සැපයිය හැකි වන හෙයින්, ඉන් පසු හුරුළු වැවට මහවැලි දියවර ගෙන යන යෝධ ඇල දඹුල්ලේ සිට සීගිරිය දක්වා ඇල මහට පහතින් පිහිටි කෙත් සරු කිරීමට යෙදිය හැකි වනු ඇත.

## තමන්කඩුව

බෝවතැන්න ජලාශයේ රැස් කෙරෙන මහවැලි ජල කඳෙන් සෑම තත්පරයකටම ජලය ඝන අඩි 15,000 කට අධික ප්‍රමාණයක් තමන්කඩුව පෙදෙසට (පොළොන්නරුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන්ට) යැවීම සඳහා අඹන් ගඟ ඔස්සේ තවදුරටත් ගලා යැවීමට සැලසුම් කොට ඇත. සැලසුම් අනුව මෙම ජල ප්‍රමාණයෙන් සෑම තත්පර යකටම ඝන අඩි 1,000 ක් ඇල හැර යෝධ ඇලට යොමු කෙරෙන අතර, තත්පරයකට ඝන අඩි 500 ක ජල ප්‍රමාණයක් කුඹුරු අක්කර 19,000 ක් සරු කරනු උදෙසා පරාක්‍රම සමුද්‍රයට යැවීම සඳහා අහමැඩිල්ල අමුණෙන් හැර වෙයි. මෙසේ ලැබෙන අමතර ජල කඳ රැගෙන යනු සඳහා ඇලහැර යෝධ ඇල පුළුල් කොට තිබේ.

ඇලහැර යෝධ ඇල ඔස්සේ ගලා යන මහවැලි ජලයෙන් ගිරිතලේ, කවුඩුල්ල, මින්නේරිය හා කන්තලේ යන වැව් පෝෂණය කෙරෙන අතර, ඇලහැර යෝජනා ක්‍රමයට ද සම්පූර්ණ ජල පහසු කම් සැපයේ. මෙම යෝජනා ක්‍රමය යටතේ දැනට වගා කරන කුඹුරු අක්කර 55,000 කට ආසන්න ප්‍රමාණයක් මෙසේ ලැබෙන මහවැලි ජලයෙන් දෙකන්නයේ හෝ තෙකන්නයේ සරු කිරීමට හැකි වී ඇති අතර, කන්තලේ අක්කර 6,000 ක උක් වගාවට ද ජල පහසුව සැලසෙයි.

මෙම අදියරෙහි දෙවන පියවරට අයත් වූයේ කලා වැව පෙදෙසහි අළුත් ඉඩම් අක්කර 57,000 ක් ද, කන්දලම වැව යටතේ අළුත් ඉඩම් අක්කර 7,000 ක් ද, නව දඹුලු ඔය ජලාශය යටතේ අළුත් ඉඩම් අක්කර 7,000 ක් ද, යනුවෙන් අළුත් ඉඩම් අක්කර 71,000 ක් සංවර්ධනය කොට ජනාවාස බිහි කිරීම ය. මෙම නව සංවර්ධන ප්‍රදේශයේ පදිංචි කර විමට නියමිත ගොවි පවුල් මුළු සංඛ්‍යාව 26,000 ක් පමණ වේ.

මේ හැර තමන්කඩුව පෙදෙසේ අළුත් ඉඩම් අක්කර 20,000 ක් ද, මහවැලි ජලයෙන් සරු කොට ගොවි ජනාවාස බිහි කෙරෙනු ඇත. මුල් සැලැස්මේ පළමු අදියරෙහි තෙවන පියවරට අයත් වන මෙම අළුත් ඉඩම් කන්තලේ, කවුඩුල්ල හා ඇලහැර යෝජනා ක්‍රමයන් යටතේ සංවර්ධනය කෙරේ.

## කඩිනම් වැඩ පිළිවෙළ

මහවැලි කඩිනම් වැඩ පිළිවෙළ අනුව මහවැලි සංවර්ධන කටයුතු (මුල් සැලැස්මෙහි 1 වන අදියරට අයත් දැනට නිම වෙමින් පවතින ඉදි කිරීම් හා අන් සංවර්ධන කටයුතු හැර) ප්‍රධාන ව්‍යාපාර දෙළහකට වෙන්කෙරිණි. මෙම ව්‍යාපාර දෙළහෙන් වඩාත් විපුල ප්‍රයෝජන ලබා දිය හැකි, වඩා වැදගත් ව්‍යාපාර පහකට ප්‍රමුඛස්ථානය දීමට රජය තීරණය කළේය, මාදුරු ඔය, වික්ටෝරියා, රන්දෙනිගල, කොත්මලේ හා මොරගහකන්ද එම ව්‍යාපාර වෙත්. මෙම ව්‍යාපාර පහ නිම කිරීමෙන් මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයෙන් අපේක්ෂිත විපුල ඵලයන් ගෙන් වැඩි කොටසක් ළඟා කර ගැනීමට හැකි වනු ඇත.

## මාදුරුඔය ජලාශය

මාදුරු ඔය ජලාශය ඉදි කරනු ලබන්නේ මාදුරු ඔය මුහුදට වැටෙන ස්ථානයට සැතපුම් 48 ක් ඔය ඉහළ දී මාදුරු ඔය හරහා යෝධ වේල්ලක් ඉදි කිරීමෙනි. මෙම වේල්ල ඉදි කිරීම සඳහා මහ වනය හෙළි පෙහෙළි කිරීමේ දී බැම්ම ඉදි කිරීමට නූතන ඉංජිනේරුවන් විසින් සැලසුම් කරන

ලද ස්ථානයේ ම මාදුරු ඔය හරහා බැඳ තිබූ යෝධ වැ කන්දක නටබුන් හමු විය. දැනුදු මේ යෝධ වැකන්ද උසින් අඩි 85 ක් ඉක්මවා සිටි. වැකන්දේ රළ පනාව පවා අද ද මැනවින් දැකිය හැකි ය.

**මාදුරු ඔය ජලාශය ඉදි කළ පසුව, එය මාදුරු ඔය ඔස්සේ ගලා එන ජල කඳ පමණක් නොව, වික්ටෝරියා හා රන්දෙනිගල ජලාශයන් ගෙන් සැපයෙන මහවැලි ජල කඳ ද දරා සිටීමට සමත් යෝධ ජලාශයක් වනු ඇත.**

යෝධ වික්ටෝරියා හා රන්දෙනිගල ජල කඳ **මිනිපේ උල්හිටිය යෝධ ඇල දිගේ ගලා අවුත් උල්හිටිය ජලාශයේ රැස්ව, සැතපුම් 3 ක් දිග මහ උමගකින් මාදුරු ඔය ජලාශය පෝෂණය කරනු ඇත.**

මෙසේ නිර්මාණය වන මාදුරු ඔය ජලාශය යටතේ තෙත් බිම් අක්කර 1,25,000 කට දෙකන්නයේ නැතිනම් තෙකන්නයේ ජල පහසුකම් සැපයිය හැකි වෙයි. මෙයින් අක්කර 1,18,000 ක් ම අළුත් ඉඩම් වන අතර, අක්කර 7,000 ක් දැනට වගා කෙරෙන එහෙත් නිසි ජල පහසුව නොමැති ඉඩම් වෙයි.



මහවැලි ජලයෙන් පිරීගිය කලංකුට්ටිය වැව

ජලාශයට එක් වන මාදුරු ඔයේ ජල කඳ වර්ග සැතපුම් 175 ක ධාරා ප්‍රදේශයකින් ගලා එන්නක් වනු ඇත. මෙම ප්‍රදේශයෙන් ජලාශයට එක්වන වාර්ෂික ජල ප්‍රමාණය අක්කර අඩි 2,60,000 ක් ද වික්ටෝරියා හා රන්දෙනිගල ජලාශයන්ගෙන් ලැබෙන අමතර වාර්ෂික ජල ප්‍රමාණය අක්කර අඩි 6,80,000 ක් ද, වනු ඇතැයි ගණන් බලා තිබේ.

ප්‍රධාන වශයෙන් පස් බැම්මක් සේ ඉදි කෙරෙන මාදුරු ඔය ජලාශයේ බැම්ම ඉදි කළ පසු උසින් අඩි 150 ක් ද, දිගින් අඩි 1780 ක් ද, වනු ඇත. **ජලාශයේ රඳවා ගත හැකි සම්පූර්ණ ජල ප්‍රමාණය අක්කර අඩි 3,24,500 ක් වෙයි**

මාදුරු ඔය ජලාශය යටතේ මෙග වොට් 5 ක ජල විදුලි බලාගාරයක් ද ඉදි කෙරෙනු ඇත.

**මාදුරු ඔය ව්‍යාපාරයේ ඉදි කිරීම් කටයුතු 1978 අගෝස්තු 14 වැනි දින ආරම්භ කරන ලදී.**

## ● වික්ටෝරියා ජලාශය

**වික්ටෝරියා ජලාශය ඉදි කෙරෙන්නේ, තෙල්දෙනිය නගරයට නුදුරු, මලවැලි ගඟේ වික්ටෝරියා ඇල්ල යයි ප්‍රකට ස්ථානය අසල ගඟ හරහා යෝධ වේල්ලක් බැඳීමෙනි,**

මුළුමනින් ම පාහේ කොන්ක්‍රීට් වලින් නිම කෙරෙන ආරුක්කුව හැඩයෙන් යුත් මෙම වේල්ල ඉදි කළ පසු මෙරට උසම වේල්ල බවට පත් වෙමින්, උසින් අඩි 338 ක් ද, දිගින් අඩි 1,400 ක් ද වනු ඇත.

ජලාශයේ රඳා සිටින මුළු ජල ප්‍රමාණය අක්කර අඩි **4,15,000** ක් වනු ඇත. මෙසේ රොක් වන ජල කඳ ජලාශ වේල්ලේ සිට සැතපුම් 3½ ක් ගහ පහළින් ඉදි කෙරෙන ජල විදුලි බලාගාරයට උමගක් මගින් යොමු කෙරෙනු ඇත. මෙම ජල විදුලි බලාගාරයේ ස්ථාපිත ජල විදුලි බල ශක්ති ප්‍රමාණය මෙගවොට් 120 ක් වනු ඇත. ජලාශය ඉදි කිරීම් කටයුතු 1980 මාර්තු 23 වැනිද ඇරඹිණි.

විදුලි බලාගාරයෙන් නික්මෙන මහවැලි ජල කඳ යළි ප්‍රධාන ගංගාවට එක්ව මිනිපේ දක්වා ගලා යනු ඇත. දැනට ඇති මිනිපේ අමුණට අඩි 500 ක් පමණ පහළින් ඉදි කරනු ලබන අඩි 700 ක් දිග නව අමුණකින් මෙම ජල කඳ මිනිපේ - උල්හිටිය යෝධ ඇළට යොමු කෙරෙනු ඇත.

### මිනිපේ - උල්හිටිය යෝධ ඇළ

මහවැලි නිම්නයේ දකුණු ඉවුර සරු කරන මෙම මිනිපේ - උල්හිටිය යෝධ ඇළ ඉදි කිරීමේ කටයුතු 1978 ජනවාරි මස 30 වැනිද ආරම්භ විණ.

**මිනිපේ සිට උල්හිටිය දක්වා සැතපුම් 19½ ක් දිගට තැනෙන මෙම යෝධ ඇළේ ඉදි කිරීම් කටයුතු දහස් හුදු මිනිස් ශ්‍රමයෙන් ම ලහි ලහියේ කෙරෙයි.**

මුළුමනින් ම කොන්ක්‍රීට් වලින් ආස්තරණය කෙරෙන මෙම ඇළ තත්පරයකට ඝන අඩි 1200ක ජල කඳක් ගෙන යාමට සමත් වන්නකි.

මිනිපේ-උල්හිටි යෝධ ඇළ දිගේ ගලා යන ජල කඳ මහවැලි නිම්නයේ දකුණු ඉවුර සරු කරමින් උල්හිටිය ජලාශයට එක් වනු ඇත.

උල්හිටිය ඔය හරහා ඉදි වන අඩි 90 ක් උස අඩි 3,500 ක් දිග වේල්ලෙන් උල්හිටිය ජලාශය නිර්මාණය වෙයි. ජලාශයේ ධාරිතාවය අක්කර අඩි 61,000 ක් වනු ඇත.

වික්ටෝරියා ජලාශයෙන් සැපයෙන ජල කඳෙන්, උල්හිටිය ජලාශය යටතේ කෙත් බිම් අක්කර 77,300 ක් දෙකන්නයේ හෝ තෙකන්න යේම වගා කළ හැකි වනු ඇත. මෙයින් අක්කර අළුත් ඉඩම් වන අතර, අක්කර 3,300 ක් මෙතෙක් වගා කළ එහෙත් නිසි ජල පහසුව නොලබන ඉඩම් වෙයි.

### රන්දෙනිගල ජලාශය

මහවැලි ගඟේ, වික්ටෝරියා ජලාශය ඉදි වන ස්ථානයට සැතපුම් 13 ක් පහළින් හා මිනිපේ අමුණට සැතපුම් 4 ක් ගඟ ඉස්මත්තෙන් රන්දෙනිගල ජලාශය ඉදි කෙරෙනු ඇත.

**මහවැලි ගඟ හරහා අඩි 290 ක් උස අඩි 1,800 ක් දිග යෝධ වේල්ලක් නිර්මාණය කිරීමෙන් ඉදි වන රන්දෙනිගල ජලාශය අක්කර අඩි 6,29,000 ක ජල කඳක් දරා සිටීමට සමත් වන්නකි.**

රන්දෙනිගල ජලාශය නිසා දෙකන්නයේ හෝ තෙකන්නයේ අස්වැද්දීමට හැකි කෙත් බිම් ප්‍රමාණය අක්කර 1,30,300 ක් වෙයි.

රන්දෙනිගල ජලාශය යටතේ මෙගවොට් 75 ක ස්ථාපිත ධාරිතාවයක් ඇති ජල විදුලි බලාගාර යක් ද ඉදි කෙරෙනු ඇත. මෙම ජල විදුලි බාලාගාරය ඉදි කෙරෙන්නේ නූතන මිනිපේ අමුණට මඳක් ඉහළිනි.

### කොත්මලේ ජලාශය

කොත්මලේ ජලාශ ව්‍යාපාරය මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ අතිශය වැදගත් ව්‍යාපාරයක් වෙයි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ කඩදොරගම අසල දී කොත්මලා ඔය හරහා යෝධ වේල්ලක් ඉදි කිරීමෙන් කොත්මලේ ජලාශය නිර්මානය කෙරේ. ඉදිකිරීම් කටයුතු 1979 පෙබරවාරි 4 වැනිද ඇරඹිණි.

**මෙම ස්ථානයේ ඉදි කෙරෙන යෝධ වේල්ල දිගින් අඩි 1927 ක් හා උසින් අඩි 352 ක් වෙයි. මෙම වේල්ල නිසා නිර්මානය වන ජලාශයේ ධාරිතාවය අක්කර අඩි 3,31,000 ක් වනු ඇත.**

කොත්මලේ ජලාශ ව්‍යාපාරය ප්‍රධාන වශයෙන් අති විශාල ජල විදුලි බලයක් නිපදවන ව්‍යාපාරයක් ලෙස හැඳින් විය හැකි ය. මෙයින් නිපදවන ජල

විදුලි ශක්ති ප්‍රමාණය මෙගවොට් 150 කි. නිම වූ පසු දිවයිනේ විශාල තම ජල විදුලි බලාගාරය වන්නේ කොත්මලේ ජල විදුලි බලාගාරය යි.

කොත්මලේ ජලාශය කෘෂිකාර්මික අතින් සළකා බලන විට ගබඩා ජලාශයක් ලෙස හැඳින්වීම වඩා උචිත වන්නේ ය. පොල්ගොල් ලෙන් හැරවෙන මහවැලි ජල කඳ වසර පුරාම උපරිම ප්‍රමාණයෙන් පවත්වා ගැනීමට කොත්මලේ ජලාශය නිසා හැකි වනු ඇත. එසේ වන්නේ මහවැලි ගඟේ ගැලීම් ප්‍රමාණය අඩු වන අවස්ථාව න්හිදී ද කොත්මලේ ජලාශයෙන් පොල්ගොල්ල හැරවුමට අවශ්‍ය ජල ප්‍රමාණය සැපයෙන ලෙස සැලසුම් සකසා ඇති බැවිනි.

මේ නිසා පොල්ගොල්ලේ හැරවුම යටතේ දැනට වගා කෙරෙන කෙත් බිම් අක්කර 1,50,000 කට ආසන්න සංඛ්‍යාව හා නුදුරු අනාගතයේ දී වගා කිරීමට නියමිත ඉතිරි අළුත් ඉඩම් අක්කර 75,000 ක් පමණ වන ප්‍රමාණය ද, අවුරුද්දේ දෙකන්නය හෝ තෙකන්නය ජල හිඟයකින් කිසිදු බාධකයක් නැතිව වගා කළ හැකි වෙයි.

කොත්මලේ ජලාශය නිසා මහවැලි නිම්නයේ අතිරේක ඉඩම් අක්කර 40,000 කට ජල පහසුකම් සැපයීමට ද හැකි වනු ඇත. මීට අමතරව පොල්ගොල්ලේ හැරවුම ස්ථාවර කිරීමෙන් උකුවෙල හා බෝවතැන්න යන ජල විදුලි බලාගාරයන් ගෙන් ද, වසර පුරාම උපරිම නිෂ්පාදනය ලබා ගත හැකි වෙයි.

වික්ටෝරියා, රන්දෙනිගල හා මොරගහ කන්ද ආදී ව්‍යාපාරයන් යටතේ ප්‍රයෝජනයට ගැනෙන ජල ප්‍රමාණය ද, කොත්මලේ ජලාශය නිසා වැඩි වනු ඇත. මේ හැර දැන් නිරන්තර යෙන් ජල ගැල්මට ලක්වන ගම්පොළ නගරය ද, මෙම ව්‍යාපාරය නිම වීමෙන් පසු ගංවතුර රකුසා ගෙන් මිදෙනු ඇත.

## මොරගහකන්ද ජලාශය

මොරගහකන්ද ජලාශය ඉදි කරනු ලබන්නේ මහවැලි ගඟේ වම් ඉවුරේ විශාලතම අතු ගංගාව වන අඹන් ගඟ හරහා වේල්ලක් බැඳීමෙනි.

නූතන ඇලහැර අමුණට මදක් ගහ ඉස්මත් තෙත් මෙම යෝධ වේල්ල ඉදි කෙරෙනු ඇත. කොටසක් පසින් හා කොටසක් කොන්ක්‍රීට් වලින් ඉදි කෙරෙන මෙම වේල්ලේ දිග අඩි 5,000 ක් වන අතර, උපරිම උස අඩි 230 ක් වනු ඇත. වේල්ලේ කොන්ක්‍රීට් කොටස පමණක් දිගින් අඩි 1,700 ක් වෙයි.

මීට අමතරව අඹන් ගඟේ වම් ඉවුරේ ගැඹුරු නිම්න තවත් වේලි දෙකකින් අහුරා ලනු ඇත. මෙයින් එක් වේල්ලක් දිගින් අඩි 1,300 ක් හා උසින් අඩි 170 ක් වන අතර, අනික් වේල්ල දිගින් අඩි 2,100 ක් හා උසින් අඩි 70 ක් වනු ඇත.

**මොරගහකන්ද ජලාශයේ සම්පූර්ණ ධාරිතාවය අක්කර අඩි 4,700 ක් වෙයි. මෙසේ මොරගහ කන්ද ජලාශයට එක් වන්නේ පොල්ගොල්ලෙන් හරවනු ලැබ අඹන් ගඟ ඔස්සේ ගලා එන ජල කඳ හා අඹන් ගඟේ ජල කඳයි.**

මොරගහ කන්ද ජලාශය යටතේ අළුත් ඉඩම් අක්කර 46,000 ක් ද, ඇතුලත් ඉඩම් අක්කර 1,30,000 කට දියවර සැපයිය හැකි වෙයි. මෙම ජලාශයට සම්බන්ධව පිහිටුවනු ලබන ජල විදුලි බලාගාරයේ ස්ථාපිත විදුලි බල නිෂ්පාදන ශක්තිය මෙගවොට් 40 කි.

## සංවර්ධන ප්‍රදේශ

මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයෙන්, වැදගත් කමෙන් වැඩි එමෙන් ම උසස්ම සේවයක් ජනතාවට ලබා දෙන මෙම මහා ව්‍යාපාර පහ (මාදුරු ඔය, වික්ටෝරියා, රන්දෙනිගල, කොත් මලේ හා මොරගහකන්ද) යටතේ සංවර්ධනය කෙරෙන කෙත් බිම් ප්‍රමාණය අක්කර පන් ලක්ෂ යකට ආසන්න වෙයි. මෙයින් අක්කර 3,40,000 ක් ම මෙතෙක් වගා නොකළ අළුත් ඉඩම් වන්නේ ය. මෙසේ අළුත් ඉඩම් සංවර්ධනය කිරීම නිසා පදිංචි කළ හැකි නව ගොවි පවුල් සංඛ්‍යාව 1,40,000 කට ආසන්න වනු ඇත.

**(මහවැලි සංවර්ධ මණ්ඩලය වෙනුවෙන් නිකුත් කරන ලද 'මහවැලි මහ විකුම' නමැති ප්‍රකාශන යෙන් සකස් කෙරිණි).**